# ධීවර අමාත්‍යාංශය

## ආපනශාලාවක් පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම - 2024/2025.

කොළඹ 10, මාලිගාවත්ත, නව මහ ලේකම් කාර්යාලයේ පිහිටි ධීවර අමාත්‍යාංශයට අයත් ආපනශාලාව පවත්වාගෙන යාමට එම කාර්යය සඳහා ලියාපදිංචි පළපුරුදු ආපනශාලා පවත්වාගෙන යන්නන්ගෙන් ධීවර අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් 2024.09.11 සිට 2024.09.24 දින පස්වරු 2.00 දක්වා මුද්‍රා තබන ලංසු භාරගනු ලැබේ.2024.10.01 දින සිට භෝජනාගාර සේවාවන් ආරම්භ කළ යුතුය.

පහත සඳහන් කොන්දේසි වලට යටත්ව මිලගණන් කැඳවනු ලැබේ.

1. කොළඹ 10, මාලිගාවත්ත පිහිටි ධීවර අමාත්‍යාංශ පරිශ්‍රයේ 500 කට ආසන්න කාර්ය මණ්ඩලයක් සේවයේ නියුතු අතර ඒ අනුව අවශ්‍යතාව පරිදි ආහාර සැපයිය යුතු අතර භෝජනාගාරය සඳහා පහත සඳහන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ.
   - ජලය
   - විදුලිය ගාස්තුවෙන් 50%ක්
   - මේස සහ පුටු
   - පිඟන් කෝප්ප
   - මුළුතැන්ගෙය සඳහා උපකරණ
   - ආහාර ප්‍රදර්ශනය කරන කබඩ් 01 ක්
   - අමාත්‍යාංශයේ කම්කරුවකු මගින් දෙවතාවක් ආපනශාලාවේ මේස පුටු පිරිසිදු කිරීම.

   ආපනශාලාව සඳහා මාසිකව කුළියක් ලෙස රු.5,000.00 අයකරනු ලැබේ. ඔබ වෙත ඉහත සඳහන් සියළු පහසුකම් සහ අවම කුළියක් අයකර, ආපනශාලාව ලබාදීමේ අරමුණවන්නේ සේවක සුභ සාධනයයි. එබැවින් කාර්ය මණ්ඩලය සඳහා සහන මිලට ගුණත්වයෙන් උසස් ආහාර සැපයීමට කටයුතු කළ යුතුය.
2. 2024.09.11 දින සිට 2024.09.24 දක්වා වැඩ කරන දිනවල පෙ.ව.10.00 සිට ප.ව.2.00 දක්වා කොළඹ 10, මාලිගාවත්ත පිහිටි ධීවර අමාත්‍යාංශයේ දෙවන මහලේ මුදල් අංශයේදී අදාල ලංසු ලේඛන ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැක.

3. ලංසුකරුගේ ලිපි ශීර්ෂයන් මඟින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත 2024.09.11 සිට 2024.09.23 දක්වා රාජකාරී දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා සහ 2024.09.24 ප.ව.12.00 දක්වා ධීවර අමාත්‍යාංශයේ මුදල් අංශය මඟින් ලංසු ආකෘතිපත්‍ර ලබාගත හැක.

4. ලංසුපත් ලබා ගැනීම සඳහා ආපසු නොගෙවනු ලබන රු.1,000/= ක මුදලක් ධීවර අමාත්‍යාංශයේ - මුදල් අංශයේ සරප් වෙත මුදලින් ගෙවා ලබාගත් රිසිට්පත ගණකාධිකාරී (සැපයීම්) වෙත ඉදිරිපත් කල පසු සිංහල භාෂාවෙන් සකස් කරන ලද ලංසු ලේඛන දෙපිටපතකින් ලබාගත හැකිය.

5. මුද්‍රා තබන ලද ලංසු 2024.09.24 ප.ව.2.00 ට පෙර ලැබෙන පරිදි ගණකාධිකාරී (සැපයුම්) , ධීවර අමාත්‍යාංශය, මාලිගාවත්ත, කොළඹ - 10 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් අතින් ගෙනවිත් ධීවර අමාත්‍යාංශයේ දෙවන මහලේ මුදල් අංශයේ පිහිටි ලංසු පෙට්ටියට බහාලීම හෝ කළ හැක. ලංසුපත් බහා එවන කවරයේ වම් උඩ කෙලවරේ " ධීවර අමාත්‍යාංශයේ ආපනශාලා සේවා ප්‍රසම්පාදනය සඳහා වන ලංසුව" යනුවෙන් පැහැදිලිව සඳහන් කල යුතුය.

6. ලංසුපත් විවෘත කරනු ලබන අවස්ථාවේදී ලංසුකරුට හෝ ඔහු විසින් බලය පැවරූ නියෝජිතයෙකුට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගිවිය හැකිය. ධීවර අමාත්‍යාංශයේ 2වන මහලේ මුදල් අංශයේදී 2024.09.24 දින ප.ව. 2.00 ට ලංසු පත් විවෘත කෙරේ.

7. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර 011-2544364 දුරකථන අංකය අමතා ගණකාධිකාරී (සැපයීම් ) වෙතින් ලබා ගත හැකිය.

ප්‍රසම්පාදන කමිටු සභාපති

ධීවර අමාත්‍යාංශය

මාළිගාවත්ත

කොළඹ 10.